දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය අනුව අස්තිත්වයක් එහි මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම් ගිණුම්කරණ භාවිතා කර පිළියෙල කළ යුතු වුවත්, සභාව විසින් ආදායම් ගිණුම්ගත කිරීමේ දී බිල් කළ ආදායම වෙනුවට වර්ෂය තුළ මුදලින් ලැබුණු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබීමෙන් ආදායම් විෂයයන් 2 කට අදාළව වර්ෂයේ ආදායම් රු. 31,741,336 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ආදායම් විෂයයන් 8 කට අදාළව වර්ෂයේ ආදායම් රු. 33,223,321 ක් වැඩියෙන් දක්වා තිබුණි.	විශේෂ කළමනාකරණ කමිටු තීරණ අනුව මුද්දර ගාස්තු, උසාවි දඩ හා ව්‍යාපාර බදු පමණක් මුදල්මය පදනමින් ගැනීමට කටයුතු කළ බව.	ප්‍රමිතය අනුව ආදායම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.7 ඡේදය ප්‍රකාරව අස්තිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.	ගිණුම්කරණ ප්‍රමිතයේ 3 පරිච්ඡේදයේ 3.7 ඡේදය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව.	ප්‍රමිතය අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.1 (ආ) ඡේදය ප්‍රකාරව වත්කමක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයක් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන්නේ නම් එය දිගුකාලීන වත්කම් ලෙස හඳුනාගැනීම කළයුතු වුවත් මහා නගර සභාව විසින් සමාලෝචිත වර්ෂය තෙක් පුස්තකාල පොත් වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් එහි ජීවිත කාලය තුළ ක්ෂය කිරීමටත් කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනයේ පුස්තකාල පොත් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය.

(ඇ)	ප්‍රමිතියේ දැක්වෙන ආකෘතියට අනුකූලව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණු හෙයින් රු. 115,554,214 ක් වූ සංචිත හා වෙන්කිරීම් පෙන්වා නොතිබුණි.	2025 අවසාන ගිණුම මගින් සිදුව ඇති දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 296 හා නියෝග 300 ප්‍රකාරව කටයුතු නොකර වර්ෂය තුළ ලැබුණු ව්‍යාපාර බදු ආදායම වර්ෂයේ ව්‍යාපාර බදු ලෙස සලකනු බවට වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය යොදාගැනීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට හිඟ ව්‍යාපාර බදු ආදායම රු. 100,969,690 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	කළමනාකරණ කමිටු තීරණය මත වර්ෂය තුළ ලැබුණු ව්‍යාපාර බදු ආදායම වර්ෂයේ ව්‍යාපාර බදු ලෙස සලකා මුදල් පදනම මත ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව.	නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.

1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිම නොකළ රු. 42,460,181 ක් වූ මංමාවත් පාරවල් හා බෝක්කු කර්මාන්ත 20 ක පිරිවැයත් රු.35,183,526 ක් වූ වැඩ නිම නොකළ ඉදිකිරීම් කර්මාන්ත පිරිවැයත් ප්‍රාග්ධනිත කිරීම නිසා වත්කම් ගිණුම් එම වටිනාකම්වලින් වැඩියෙන් දක්වා තිබුණි.	2024.12.31 දිනට බිල්පත් ඉදිරිපත්ව තිබූ බැවින් එම කර්මාන්ත ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන ලද බව හා 2025 වර්ෂයේ නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ංමාලෝචිත වර්ෂය තුළ කාණු ශුද්ධ කිරීම සඳහා දරන ලද රු. 7,096,861 ක පිරිවැය මංමාවත්, පාරවල් හා බෝක්කු ගිණුමට ප්‍රාග්ධනිත කිරීම නිසා එම වත්කම් ගිණුම සමාන වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට කේබල් ටී වී ව්‍යාපෘතියෙන් අයවිය යුතු බදු කුලි රු.4,500,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	සභාවේ කළමනාකරණ කමිටුවේ තීරණය මත පොත්වලින් කපා හැරීමට ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. ආණ්ඩුකාරවරයාගේ පිළිතුරු ලිපියට අනුව ඉදිරි කටයුතු සිදු කරන බව.	අයවිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට කලින් ලද කඩකුලි ආදායම වූ රු.201,246 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කිරීම නිසා එම වටිනාකමින් වර්ෂයේ අතිරික්තය වැඩියෙන්ද ජංගම වගකීම් අඩුවෙන් ද දක්වා තිබුණි.	2025 වර්ෂයේ වරද නිවැරදි කරන බව.	කලින් ලද ආදායම් නිවැරදිව ගිණුම් තැබීමට

		කටයුතු කළ යුතුය.
(ඉ) සංශෝධිත මූල්‍ය තත්ත්ව විස්තරයට අනුව 2024 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්/ ස්කන්ධ රු. 6,135,300,638 ක් වුවද, විගණනයේ ගණනය කිරීම් අනුව සමුච්චිත අතිරික්තය/(ඌණතාවය) රු. 5,463,997,883ක් ද, අතිරික්තයේ /ඌණතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.994,130,865 ක් ද වූයෙන් මුළු ස්කන්ධය රු. 6,458,128,748 ක් විය. ඒ අනුව රු. 322,828,110 කින් ස්කන්ධය වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සිදුව ඇති දෝෂ නිවැරදි කිරීම තුළින් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.4 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.54,912,936 ක වෙනසක් පැවැතුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නොසැසඳීම් පරීක්ෂාකර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය
(ආ) මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 05 යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් භෞතික සැලසුම් ලෙස රු. 115,554,214 ක් දක්වා තිබුණ ද විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව එම අගය රු.109,340,340 ක් වූයෙන් රු. 6,213,874 ක වෙනසක් පැවැතුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නොසැසඳීම් පරීක්ෂාකර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග			

(i)	373.1	අතැති තොගවල අගය වාර්ෂික ගිණුම්වල ඇතුළත් කිරීමේ කාර්යය සඳහා එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග භෞතිකව සත්‍යාපනය කර ප්‍රමාණාත්මකව හඳුනා ගැනීමක් කළ යුතු වුවත් අයිතම් 899 ක් සත්‍යාපනය කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මඟින් 2024.12.31 දිනට තොග භෞතිකව සත්‍යාපනය කර ප්‍රමාණාත්මකව හඳුනා ගැනීමට කටයුතු කරන බව.	නියෝගයට අනුව කටයුතු කළ යුතුය.
(ii)	477.2.2	අත්තිඩිය ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා අංගනයේ ගොඩනැගිලි ද්‍රව්‍ය අයිතම 4 කට අදාළව කියුබ් 87.39 ක හා අයිතම 3 කට අදාළව ඒකක 291 ක ඌණතාවයක් හා අයිතම 2 කට අදාළ කියුබ් 12.16 ක අතිරික්තයක් පැවතියද, ඒ සම්බන්ධව කටයුතු කර නොතිබුණි.	2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ඌණතාවයන් පිළිබඳව හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කර පරීක්ෂණ මණ්ඩල පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	නියෝගයට අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මු.රෙ.139 (8)	සහතික කරන ලද වවුචර් වෙනුවෙන් ගෙවීම් කිරීමට බලයලත් නිලධාරියකු, සෑම ගෙවීමක්ම එකිනෙහිම නියමිත ලේඛනවල සටහන් කරන බව සහ විධිමත් පරිදි ගිණුම් ගත කරන බවට ගණන්දිමේ නිලධාරියාට වගකිව යුතු වුවද, 2024 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්ට අදාළ එකතුව රු. 37,444,588 ක් වූ ගෙවීම් වවුචර් 04 ක් මුදල් පොතේ සටහන් වී නොතිබූ අතර ඒ සඳහා තිරු හිස්ව තබා තිබුණි.	2024 වසර අවසානයේ පොත් තැබීම් අංශයේ පවතින කාර්යබහුලතාවය හේතුවෙන් උක්ත වවුචර් 4 ක් මුදල් පොතේ සටහන් කිරීම අතපසු වූ බව.	මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ.272 (3) (4)	2024 දෙසැම්බර් මාසයට අදාළ එකතුව රු.204,496,091 ක් වූ ගෙවීම් වවුචර් 32 ක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	විගණන අවස්ථාවේ ගෙවීම් සිදු කර නොතිබූ හෙයින් එම වවුචර් විගණනයට යොමු නොකළ බව.	මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතුය.
(iii)	මු.රෙ.386 (7) හා මු.රෙ.391 (ආ)	2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා එකතුව රු.1,790,418,897ක් වූ චෙක්පත් උප පත්‍රිකා 1538 ක් චෙක්පොතෙහිම සුරක්ෂිතව තබා ගැනීම වෙනුවට උප පත්‍රිකා චෙක්පොතෙන් ඉවත් කර අවිධිමත් ලෙස බෑගයක දමා තබාගැනීමට කටයුතු කර තිබීම නිසා විගණන කටයුතු සඳහා චෙක්පත් උප පත්‍රිකා ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි.	2025 වර්ෂයේ සිට චෙක්පත මුද්‍රණය කිරීමෙන් අනතුරුව උප පත්‍රිකා වෙන් කර නැවත චෙක් අංක පිළිවෙලට සකසා සුරක්ෂිතව තැබීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

(ඇ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 06 ඡේදය	මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ තක්සේරු ක්‍රමවේදයට අනුව රජයේ ඉඩම් තක්සේරු කර ගිණුම්කරණය කළ යුතු වුවත්, 2022 වර්ෂයේ දේපළ සමීක්ෂණය මගින් හඳුනාගන්නා ලද දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වූ ඉඩම් 209 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	නගර සභාව සතු ඉඩම් තක්සේරු කිරීම සඳහා පත් කර ඇති කමිටුව විසින් මේ වන විට ඉඩම් තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, එම තක්සේරුව අනුව ඉඩම් ප්‍රාග්ධනිත කර 2025 මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කරන බව.	චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.1,330,378,086 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.810,103,015 ක් විය.

2.2 මූල්‍ය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රවර්ථන වර්ෂයේදී මහා නගර සභාව විසින් මහජන බැංකුවේ පැවති ඉතිරි කිරීමේ ගිණුම වසා දමා තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මහජන බැංකුවේ පැවති ඉතිරි කිරීමේ ගිණුමේ පැවති ශේෂය ප්‍රධාන ජංගම ගිණුමට මාරු කර ගිණුම වැසීමට කටයුතු කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ආ)	වනරතන පාරේ සිට ෆොන්සේකා පාර දක්වා මාර්ගය පුළුල් කිරීම සඳහා සභාව විසින් රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය පොදු තැන්පත් ගිණුමේ 2018 මාර්තු 06 දින තැන්පත් කර තිබුණු රු.4,500,000 ක් මේ දක්වා නිශ්කාර්යව පැවැතුණි.	මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා පැන නැගුණු හෙයින් එම කාර්යය ප්‍රමාද වූ බව.	අදාළ කාර්යය නිම කිරීමට හෝ එසේ නොහැකි නම් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2024 ඇස්තමේන්තුගත ආදායම (රු.) '000	2024 බිල්කළ ආදායම (රු.) '000	2024 රැස්කළ ආදායම (රු.) '000	2024 දෙසැ. 31 දිනට මුළු හිඟය (රු.) '000	2023 ඇස්තමේන්තුගත ආදායම (රු.) '000	2023 බිල්කළ ආදායම (රු.) '000	2023 රැස්කළ ආදායම (රු.) '000	2023 දෙසැ. 31 දිනට මුළු හිඟය (රු.) '000
වරිපනම් හා බදු	846,966	879,875	753,555	910,129	785,505	834,504	680,471	680,471
කුලී	20,500	14,627	39,088	9,808	15,798	20,522	29,439	13,661
බලපත්‍ර ගාස්තු	10,000	9,925	8,144	_	9,325	9,530	5,204	4,326
වෙනත් ආදායම්	19,857	18,556	23,674	12,995	16,456	20,381	24,778	13,887
එකතුව	897,323	922,983	824,461	932,932	827,084	884,937	739,892	712,345

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම්**		
(i)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ වරිපනම් ශේෂය රු. 763,796,919 ක් වූ අතර, ඉන් රු. 572,513,928 ක් හෙවත් සියයට 75 ක් වර්ෂය තුළ අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	කොරෝනා නිසා ඇති වූ ආර්ථික ගැටළු මේ වන තෙක් සෘජුවම මෙම වරිපනම් හිඟයට බලපා ඇති බව හා දේපල තහනම් කිරීමේ ක්‍රියා මාර්ග වලට සභාව අවතීර්ණ නොවූ බව.	හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට දේපළ 45,685 ක රු.900,541,672 ක වරිපනම් හිඟයක් පැවතුණි.මෙම හිඟය තුළ රු. 50,000 ත් රු.100,000 ත් අතර වටිනාකමකින් යුත් දේපළ 1474 කින් රු. 104,615,997 ක් ද රු.100,000 ට වැඩි වටිනාකමකින් යුත් වරිපනම් ඒකක 1315 කින් රු. 452,128,277 ක් ද අයවීමට පැවතුණි.	කොරෝනා නිසා ඇති වූ ආර්ථික ගැටළු මේ වන තෙක් සෘජුවම මෙම වරිපනම් හිඟයට බලපා ඇති බව හා දේපල තහනම් කිරීමේ ක්‍රියා මාර්ග වලට සභාව අවතීර්ණ නොවූ බව.	හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) **කසළ බදු**

	සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට සභාවට අයවිය යුතු කසළ ගාස්තු ආදායම රු.12,204,244 ක් විය.	2024.12.31 හිඟ මුදලින් 2025.05.31 දිනට අය කළ වටිනාකම රු. 4,508,841 ක් බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ) **කුලී**

(i)	කඩකුලී ලේඛන සභාව සතුව නොවූ අතර පරිගණක පද්ධතියෙන් කඩකුලි සම්බන්ධ තොරතුරු පවත්වාගෙන යන බවත් එමඟින් පෙර වර්ෂයේ හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබීම් හා ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ලැබීම් කොපමණ ද යන්න වෙන් වෙන් වශයෙන් ලබා ගත නොහැකි බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කඩකුලි ආදායම් රැස් කිරීමේ කාර්යක්ෂමතාව පිළිබඳව පරීක්ෂා කර තහවුරු කර ගත නොහැකි විය.	2025 ජනවාරි මස සිට අනෙකුත් කඩ කුලී වාර්ථා නිවැරදි කර ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළුව විසඳීමට හැකි වනු ඇති බව.	තොරතුරු නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ii)	හිඟ කඩකුලී සම්බන්ධ කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොවූ බැවින් වර්ෂය අවසානයේ පවතින හිඟය කොපමණ කාලයක සිට ඉදිරියට එමින් පවතින හිඟයක් ද යන්න පරීක්ෂා කර තහවුරු කරගත නොහැකි විය.	පරිගණක පද්ධතියේ පෙර වර්ෂයේ හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබීම් හා ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ලැබීම් කොපමණ ද යන්න වෙන් වෙන් වශයෙන් ලබා ගැනීමට 2024 දෙසැම්බර් දක්වා නොහැකි වූ බව.	හිඟ කඩ කුලීයට අදාළ නිවැරදි තොරතුරු පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	2024 දෙසැම්බර් 31 දිනට පැවති හිඟයෙන් රු.100,000 ට වැඩි හිඟ පවතින දේපළ 42 කින් රු.10,999,055 ක් ද රු. 50,000 ත් රු. 100,000 ත් අතර හිඟ පවතින දේපළ 28 කින් රු.2,094,912 ක් ද අය කර ගැනීමට පැවතුණි.	2024.12.31 දිනට පවතින හිඟයෙන් රු.100,000 ට වැඩි හිඟ පවතින දේපළ 42 න් හිඟයෙන් 2025.06.11 දිනට රු.920,309.74 ක් ගෙවා ඇති අතර රු.50,000 ත් රු.100,000 ත් අතර හිඟ පවතින දේපළ 28 කින් රු.902,874.55 ක් ද ගෙවා ඇති බව හා ගෙවීම් නොකළ කඩ මුද්‍ර තැබීමට කටයුතු කර ඇති බව.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(iv)	මහා නගර සභා මුල්‍යා පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 313 ප්‍රකාරව, දේපළ බදු දීම හෝ කුලියට දීමෙහි ලා කටයුතු කිරීමේ දී මූලික නීතියෙහි සහ නියෝග යටතේ සඳහන් විධිවිධාන නිසි ආකාරයෙන් අනුගමනය කිරීමට පළාත් පාලන ආයතනයෙහි විධායක ප්‍රධානියා හෝ පරිපාලන ප්‍රධානියා විසින් සියලුම පියවර ගත යුතු බවට දක්වා ඇති නමුත් දේපළ 10 ක් ගිවිසුම් ගතවීමෙන් තොරව බදු දී තිබුණි.	එම දේපල 10 න් එක් දේපලක් මේ වන විට ටෙන්ඩර් කර ගිවිසුම්ගත වීමට කටයුතු කර ඇති බව හා අනෙකුත් දේපල 07 ක් මුද්‍රා තැබීම සඳහා ආදායම් පරීක්ෂක අංශය වෙත යොමු කර ඇති බව.	මුල්‍යා පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අනුව කටයුතු කළ යුතුය.

(v)	මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 312 ප්‍රකාරව ගිවිසුමට අදාළ මාසික කුලී මුදල් ගෙවිය යුතු මාසයෙහි 10 වැනි දින හෝ එදිනට පෙර ගෙවිය යුතු වුවද ආදායම් අංශයෙන් ලබා දී ඇති තොරතුරු අනුව සභාව විසින් බදු දී ඇති දේපළ 15 න් 12 ක 2024 දෙසැම්බර් 31 දිනට හිඟ කුලිය රු.2,272,550 ක් විය.	2024 දෙසැම්බර් 31 දිනට පැවති හිඟයෙන් 2025 මැයි 31 දින වන විට රු 651,229 ක මුදලක් මේ වන විට අයකර ගැනීමට කටයුතු කර ඇති බව.	හිඟ කුළී ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
(i)	මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 296 ප්‍රකාරව, සෑම මහා නගර සභා බල ප්‍රදේශයකටම කර්මාන්ත බද්ද හා ව්‍යාපාර බද්ද යටතේ ඇති දේපළ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර සෑම වර්ෂයකදීම අදාළ ලැයිස්තු පිළියෙල කිරීම බද්දට අදාළ වර්ෂයෙහි මාර්තු 31 දිනට පූර්වයෙන් ආදායම් පරීක්ෂකවරුන් විසින් සිදු කළ යුතු වුවත්, 2019 වර්ෂයෙන් පසුව සභාව විසින් එකී සමීක්ෂණය සිදු කිරීමකින් තොරව 2023 වර්ෂය දක්වාම 2019 වර්ෂයේ සමීක්ෂණ තොරතුරු මත පදනම්ව වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. 2024 වර්ෂය සඳහා සමීක්ෂණ කටයුතු සිදු කර ඊට අදාළ ලැයිස්තුවක්ද පිළියෙල කර නොතිබුණි.	සමීක්ෂණයක් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් ආදායම් පරීක්ෂක නිලධාරීන් නොමැති බව.	නියෝග ප්‍රකාරව සමීක්ෂණ කළ යුතුය.
(ii)	2024 වර්ෂයේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට අදාළව ඉහත උපදෙස් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා වෙළඳ බලපත්‍ර ලේඛනයට ඇතුළත් නොවීමෙන් බිල් කිරීම් සිදුනොකළ හා බලපත්‍ර නිකුත් නොකළ ආයතන මෙන්ම 2024 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණද බිල්කර නොමැති ආයතන ද විය.	සමීක්ෂණයක් සිදු නොවීම නිසා නිවැරදි වටිනාකමක් ගණනය කළ නොහැකි වූ බව.	නිවැරදිව සමීක්ෂණයක් සිදුකර බලපත්‍ර ගාස්තු බිල් කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	වෙළඳසැල් 683 ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සිදු කර තිබුණද, ඉන් ආයතන 47 ක් සඳහා පමණක් නඩු පැවරීමට කටයුතු කර තිබුණි. නඩු නොපැවරූ වෙළඳසැල් සංඛ්‍යාව, බලපත්‍ර නොලත් මුළු වෙළඳසැල් සංඛ්‍යාවෙන් සියයට 93 ක් විය.	කාලසීමාව ඉක්මවා ඇති ව්‍යාපාරවලට විරුද්ධව නඩු පවරා ඇති අතර වෙළඳ බලපත්‍ර නොගත් ව්‍යාපාර සඳහා ඉදිරියේ දී නඩු පැවරීම තුලින් ඉහල ප්‍රගතියක් අපේක්ෂා කරන බව.	නීතිමය කටයුතු කඩිනම් කළ යුතුය.

2.4 අධිභාර

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් 1995 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී පැනවූ අධිභාර වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. 2,437,078ක් අයකර ගැනීමට තිබුණි.	පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලද වහාම ඒ අනුව කටයුතු කරන බව.	අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ ඉඳුල් කසළ විකිණීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද වර්ෂය තුළ රු.19,283,580 ක වියදමක් දරා ඉඳුල් කසළ ටොන් 19,284 ක් කරදියාන කසළ අංගනයට බැහැර කර තිබුණි. මේ අනුව කසළ වෙනත් පාර්ශවයකට විකිණීමට හෝ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර පොහොර විකිණීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.	ඉඳුල් කසළ එකතු කිරීමේ ව්‍යාපෘතියට ගිවිසුම් ගත වී තිබුණ ද ගිවිසුම් ගත වූ පාර්ශවය විසින් එකතු කරන ලද මුළු ඉඳුල් කසළ ප්‍රමාණයක් රැගෙන නොයාම මත පෙර පරිදිම කරදියාන කසළ අංගනයට බැහැර කිරීම සිදු කළ බවත් නැවත බාහිර පාර්ශවයට ලබාදීමට කටයුතු සැලසුම් කර ඇති බවත්, කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් භූමි නොමැතිවීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ගැටළුකාරී බව.	කසළ බැහැර කිරීමේ පිරිවැය අවම කර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජීවවායු නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා රු. 2,500,000 ක් ද, ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා රු.5,000,000 ක්ද, බූම් ට්‍රක් 01, ට්‍රැක්ටර් 05 ක් මිලදීගැනීම සඳහා රු. 30,000,000 ක් හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු. 6,000,000 ක් ද වශයෙන් මුළු ප්‍රාග්ධන පිරිවැය සඳහා රු. 43,500,000 ක් අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද ඉන් රු. 2,573,144 ක් වැය කර කාර්යාල උපකරණ මිලදී ගැනීම පමණක් සිදුකර තිබුණි.	ජීව වායු නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා ගල්කිස්ස සුසාන භූමිය පිටුපස කොටසක් තෝරා ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට නොහැකි වූ බවත්, අවශ්‍ය ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා මේ වන විට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ද ලැබී ඇති බව හා කඩිනමින් මිල දී ගැනීමට අපේක්ෂා කරන බව.	ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කරමින් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3.2 ආර්ථික නොවූ ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
භාවිතයට නොගන්නා අන්තර්ජාල සම්බන්ධතා සඳහා 2024 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා රු.309,260 ක් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවා තිබුණි.	2024 ජුනි මස සිට බිල්පතෙන් ඉවත් කර ඇති අතර සිදුව ඇති දෝෂය නිවැරදි කර ඇති බව.	වියදම් පිළිබඳව මනා පාලනයන් පවත්වා ගත යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	චෙක්පත් නිකුත් කිරීම් ලේඛනයේ චෙක්පත් අංකය පමණක් සඳහන් කර තිබුණ නමුත් අදාළ ගෙවීම් විස්තරයක් ඇතුළුව ගෙවීම් ලාභියාට චෙක්පත භාරදුන් බවට තොරතුරු කිසිවක් සඳහන් නොවූ එකතු වටිනාකම රු.198,770,400 ක චෙක්පත් 256 ක් විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 17 දිනට විය.	2025 වසරේ සිට චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයේ අදාළ තොරතුරු එදිනෙදා සටහන් කරනු ලබන බව.	නිවැරදිව ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.
(ආ)	පරිගණක පද්ධතිය මඟින් ලබා දෙනු ලබන 2024 වර්ෂය තුළ අවලංගු කරන ලද චෙක්පත් වාර්තාවට අනුව අවලංගු කරන ලද චෙක්පත් 30 ක් අතරින් රු.1,937,125 ක් වටිනා චෙක්පත් 13 ක් අවලංගු කිරීමට හේතු සඳහන් කර නොතිබුණු අතර චෙක්පත් අවලංගු කරන ලද දින පිළිවෙලට උක්ත වාර්තාව පිළියෙල කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට අවලංගු කරන ලද චෙක්පත්වල අවලංගු කිරීමට හේතුව සඳහන් කරන බව.	නිවැරදිව ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඇ)	මුදල් පොතේ සහ බැංකු ප්‍රකාශයේ සඳහන් වූ, චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයේ සඳහන් නොවූ චෙක්පත් 12 ක එකතු වටිනාකම රු. 1,987,681 ක් විය.	වර්තමානය වන විට චෙක්පත් මුද්‍රණය කර අත්සන් තබන අවස්ථාවේදීම චෙක්පත් ලේඛනයේ සටහන් කරන බවත් විධිමත් චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා ගෙන යන බවත්.	චෙක්පත් ලේඛනය නිවැරදිව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	එස්.ද.එස්.ජයසිංහ සමරු රඟහලේ පවතින ආපනශාලාව අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව රු. 1,522,350 ක් (එකතු කළ අගය මත බදු රහිත) වැය කර අලුත්වැඩියා කර වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද, 2025 මැයි වන විටත් එය විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.	ආපන ශාලා පරිශ්‍රයේ ජල සම්බන්ධතාවය විසන්ධිවීම තුළ හිඟ මුදල් ගෙවීමට යම් කාලයක් ගතවීම ද මෙම ප්‍රමාදයට බලපා ඇති බව ඇප තැන්පතු මුදල් ගෙවා ආපන ශාලාව ආරම්භ කරන ලෙසට බදු කරු මේ වන විට දැනුවත් කර ඇති බව.	ආපන ශාලාව විවෘත කිරීමට කටයුතු යුතුය.

(ඉ)	මහා නගර සභාවේ මොඩියුල 10 කින් යුත් ERP මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම, පුහුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා 2016 දෙසැම්බර් 23 දින පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ගිවිසගත් දින සිට සති 52 කින් ගිවිසගත් කාර්යයන් නිම කර භාර දියයුතු වුවත් එලෙස කාර්යයන් ඉටු කර නොතිබුණි. ඒ අනුව 2018 අප්‍රේල් 26 දින හා 2021 ජනවාරි 01 යන දින වලදී සංශෝධිත ගිවිසුම් වලට එළඹී තිබූ අතර පසුව 2024 පෙබරවාරි 06 දින නැවත දෙපාර්ශවය අතර පරිපූරක ගිවිසුමකට අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.		
(i)	2024 පෙබරවාරි 6 වන දින වන විට ERP මෘදුකාංග පද්ධතියෙහි මොඩියුල 4 ක, එනම් වරිපනම් පද්ධතිය,වෙනත් සේවා මඟින් ගාස්තු අයකිරීම (Collect Fees For Miscellaneous Services and Items) තක්සේරු හා අගය කිරීම (Valuation and Assessments) සහ තොග පාලනය යන මොඩියුල පමණක් නිම කිරීමට එනම් මුළු ගිවිසුම්ගත මෘදුකාංග පද්ධතියෙහි 30% පමණ නිමකිරීම සඳහා ගිවිසුම්ගත වී වසර 7 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි.ඒ අනුව ආයතනයට මෘදුකාංග සැපයීම, ස්ථාපනය කිරීම, පුහුණු කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ශක්‍යතාවයක් පැවතියේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.	මෙම ව්‍යාපෘතිය සාර්ථක වීම කෙරෙහි තාක්ෂණික යටිතල පහසුකම් සපුරාගත යුතු වූ බැවින් සුදුසු පරිදි එම පහසුකම් සපුරාගැනීමට අමතර කාලයක් ගත වූ බව.	ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්ශවය අතර ඇති කරගත් පරිපූරක ගිවිසුමෙහි 10 වන කොන්දේසියට අනුව ඉටු කිරීමට නියමිත කාර්යයන් 10 ට අදාළව ගිවිසුම් පිරිවැය රු. 20,933,505 ක් විය. ගිවිසුම ප්‍රකාරව 2024 අගෝස්තු 05 වන දින වන විට කාර්යයන් නිම කර නොතිබූ ERP මෘදුකාංග පද්ධතිය භාරදීම (Sign – Off and Commissioning) කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් නිමකරගෙන නොතිබුණි.	2016 දී ගිවිසුම් ගත වූ මුදලටම වර්තමානයට අදාළ වන පරිදි සංවර්ධනය කිරීමට දෙපාර්ශවය විසින් එකඟතාවයකට එළඹී අතර ඒ අනුව අදාළ කාර්ය සඳහා වැඩි කාලයක් ගතවූ බව.	**ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය.**

(iii)	ERP මෘදුකාංග පද්ධතිය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට දරා තිබූ මුළු පිරිවැය රු. 14,952,718 ක් වුවද මෘදුකාංග වත්කම් ගිණුමට රු. 11,364,041 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වත්කම් ගිණුම රු. 3,588,677 කින් අඩුවෙන් දක්වා තිබුණි.	සිදුවී ඇති දෝෂය හඳුනාගත් අතර, එය 2025 මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුගත කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	මහා නගර සභාවේ ERP පද්ධතියට සම්බන්ධිත වරිපනම් මොඩියුලය මගින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ රු. 831,600,200 ක බිල්කළ ආදායම හා රු. 900,541,672 ක හිඟ වරිපනම් ආදායමෙහි නිවැරදිතාවය එම අංශය විසින් පොත්පත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් තහවුරු කරගත නොහැකි වූ අතර ERP පද්ධතියෙහි වරිපනම් මොඩියුලය පරීක්ෂා කිරීමට විගණනයට ප්‍රවේශය ලබා නොදීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම අගයන්හි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කිරීමට නොහැකි විය.	පද්ධතිය භාවිතයෙන් විශේෂිත අවස්ථාවල හෝ ක්‍රියාකාරකම් සඳහා ඉල්ලුම මත විගණකවරුන් හට පද්ධතිය පරීක්ෂා කිරීමට View option ප්‍රවේශය ලබාදිය හැකි බවත් ,සභාව විසින් සපුරාලිය යුතු අමතර අවශ්‍යතා ඇත්නම් ඒ පිළිබඳව ලිඛිතව දන්වා ඇති බව.	ERP පද්ධතියෙහි වරිපනම් මොඩියුලය අදාළව නියමු ව්‍යාපෘති අවස්ථාවේදී පොත්පත් ලේඛණ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 92,248,253 ක් වූ තොග ශේෂය තුළ රු. 1,214,764 ක් හා රු. 17,496,099 ක් වශයෙන් නිරවුල් නොවූ තොග ශේෂයන් 2 ක් විය.	නැවත ගබඩා භාර දීමේදී ඔවුන්ගේ තොග ඌනතාවයන් පැවතීම හේතුවෙන් මෙම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් අත්හිටුවා ඇති අතර ඉදිරි පරීක්ෂණ කටයුතු සිදු කර විශ්‍රාම පාරිතෝෂිතයෙන් හානිය අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා නගර සභාවට අයත් ජයිකා ව්‍යාපෘතිය හරහා ලැබී තිබූ පරිත්‍යාග, පරිත්‍යාග ලේඛණයක සටහන් කර නොතිබුණි.	එම අයිතම පිළිබඳ පූර්ණ ලෙස පරීක්ෂා කොට ඒවායේ ලෙජර් ශේෂ වලට ද ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව හා අයිතමයන් කඩිනමින් වෙන්දේසි කොට ගබඩාව සම්පූර්ණයෙන් නිරවුල් කරන ලෙසට යාන්ත්‍රික දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දී ඇති බව.	ලේඛනයක සටහන් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	මහා නගර සභාවට අයත් ජයිකා ගබඩාව හා ගරාජ ගබඩාවේ තොග පොත් පවත්වාගෙන ගොස් නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය සඳහා ජයිකා ගබඩා භාරකරු විසින් සමීක්ෂණය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද තොග පොතට අනුව ශේෂයන් 2023 හා 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමඟ නොගැලපීම හේතුවෙන් පදනම් විරහිතව ලබාදුන් ශේෂයන් අනුව භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණි. ඒ අනුව ජයිකා ගබඩාවේ 2024 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් අයිතම වර්ග 142 කට අදාළ අයිතම 290 ක අතිරික්තයක් ද අයිතම් වර්ග 102 කට අදාළව අයිතම 517 ක ඌණතාවයක් ද විය.	පූර්ණ ලෙස පරීක්ෂා කොට ඒවායේ ලෙජර් ශේෂ වලට ද ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව.	නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මහානගර සභාව විසින් භාවිතා කරනු ලබන වාහනවල අළුත්වැඩියාවලට අවශ්‍ය වන අමතර කොටස් අයිතම වර්ග 42 ට අදාළව ඒකක 4563 ක් ජයිකා ගබඩාවේ තිබියදී ඒවා භාවිතා නොකර අයිතම ඇණවුම් කිරීමට කටයුතු කර තිබුණි.	ජයිකා ගබඩාවේ හඳුනා ගන්නා ලද මෙම දෝෂයන් යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බව හා අදාළ දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව.	වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය.
(ඇ)	ගබඩා භාරකරුවන් ලෙස සේවය නියුතු නිලධාරීන් විසින් ගරාජ ගබඩාවේ තොග පොත් පවත්වාගෙන ගොස් නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී දෙසැම්බර් 31 දිනට පැවති තථ්‍ය ශේෂයේ නිවැරදිතාව තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.	පූර්ණ ලෙස පරීක්ෂා කොට ඒවායේ ලෙජර් ශේෂ වලට ද ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව.	තොග සමීක්ෂණ නිවැරදිව සිදුකළ යුතුය.
(ඉ)	සෑම මාසයක් අවසානයේදීම ගබඩා ලේඛන හා ගිණුම් අංශ වාර්තා අනුව ඉන්ධන ලීටර් 300 කට ආසන්න විචලතාවයන් පැවතිය ද එම විචලතාවයන් නිවැරදි කර ගැනීමට පියවර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඩීසල් ගබඩාවේ ලීටරයක් රු.286 ක් වූ ඩීසල් ලීටර් 1,669.19 ක ඌණතාවයේ වටිනාකම රු.477,388 ක් විය.	ඩීසල් පොම්පය අබලි තත්ත්වයේ පැවතීමත් ඩීසල් ගබඩාවේ ද්‍රව වාෂ්පශීලීතාවය හේතුවෙන් සිදුවන හානී ඉදිරියේදී නව ඩීසල් පොම්පයක් මිලදී ගැනීම හරහා නිරාකරණය කර ගැනීමට කටයුතු කරන බව.	හානිවලට නිශ්චිත හේතු හඳුනාගෙන එම විචලතාවයන් ඇති නොවන පරිදි කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට පැවති සේවක ණය ශේෂය තුළ ස්ථාන මාරු වී ගිය සේවකයන් 8 දෙනෙකුගෙන් රු. 42,865 ක් හා විශ්‍රාම ගිය 19 දෙනෙකුගෙන් රු. 704,849 ක් අයකරගත යුතුව පැවැතුණි. එමෙන්ම, විශ්‍රාම ගිය 24 දෙනෙකුගෙන් වැඩිපුර අයකරගෙන තිබුණු රු. 30,050 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	තොරතුරු සොයා බලා ඉදිරියේ දී එම මුදල අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා පළාත් පාලන ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 08 ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සභාවේ මූල්‍ය ප්‍රකාශන දින 115 ක් ප්‍රමාද වී 2025 ජූනි 30 දින ඉදිරිපත් කරන ලදී.	පිළිතුරු ලැබී නොමැත.	ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අනුව කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 53 ක් යටතේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.418,202,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් රු.36,312,030 ක් පමණක් උපයෝජනය කර තිබුණි.	විශේෂඥ දැනුම සහිත නිලධාරීන්ගේ සහය ලබා ගැනීමේදී ගැටළු මතුවීම වැනි කරුණු හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වූ බව.	ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.
(ආ)	ආගමික, ක්‍රීඩා ,විනෝද කටයුතු හා වෙනත් සුභ සාධක කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ වත්කම් අත්පත් කර ගැනීම ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනාගෙන ප්‍රතිපාදන වශයෙන් රු. 114,502,000 ක් වෙන්කර ගෙන තිබුණද, ඉන් රු.1,778,527 ක් වැයකර පුස්තකාල පොත් මිලදී ගැනීම හා රු.45,999 ක්	විශේෂඥ දැනුම සහිත නිලධාරීන්ගේ සහය ලබා ගැනීමේදී ගැටළු මතුවීම වැනි කරුණු හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වූ බව.	ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.

	වැයකර කාර්යාල උපකරණ මිලදී ගැනීම පමණක් සිදුකර තිබුණි. පුස්තකාල, පෙර පාසැල් හා ක්‍රීඩා අංශයන් මගින් මහජනයා වෙත ප්‍රශස්ථ සේවාවක් සැපයිම සඳහා හඳුනාගෙන තිබු ප්‍රාග්ධන වත්කම් එකී අංශ වෙත සපයා දීමට අවශ්‍ය කටයුතු ඉටුකර නොතිබුණි.		
(ඇ)	සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 69 ක් සඳහා වෙන්කර තිබුණු රු.245,048,000 කින් කිසිදු වියදමක් දරා නොතිබුණි.	විශේෂඥ දැනුම සහිත නිලධාරීන්ගේ සහය ලබා ගැනීමේදී ගැටළු මතුවීම වැනි කරුණු හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වූ බව.	ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.